# අපේ භාෂා සම්ප්‍රදාය - යුගල පද

*ක්‍රියාකාරකම 01 –*

“අ” කොටසේ ඇති පද සමග "ආ” කොටසේ ඇති යුගල පද තෝරන්න. ගලපන්න

1. බණ (කතන්දර, දහම්, උගත්)
2. අබල (පහළ, බබල්, දුබල)
3. කයි (වාරු, කතන්දර, කවට)
4. ළමා (බමයි, තුලා, ළපටි)
5. සැප (සනීප, සංකා, පහටු)
6. ලේසි (පහත්, පහසු, පදම්)
7. අතන (පහළ, වාන්දු, මෙතන)
8. දුගී (පිලිවෙත්, දුප්පත්, සල්ලාප)
9. මිල (මුදල්, දහම්, මුකුළු)
10. කොට්ට (පෙට්ටි, මෙට්ට, ලොට්ට)
11. ලී (ආයුධ, පෙට්ටි.දඬු)
12. ගුරු (දොස්, වැයම්, ගෝල)
13. අවුල් (හිලවු, වියවුල්, පවුල්)
14. ලිපි (නඩි, ගොඩ, ලේඛන)
15. කතා (බතා, බහ, තුලා)

*ක්‍රියාකාරකම 02 –*

ඉරි ඇඳි පදය වෙනුවට යෙදිය හැකි යුගල පදය ඇති යුගල පද අතරාන් තෝරන්න.

1. බොහෝ පොත්පත් කිය වූ නිර්මලා අවශ්‍ය තොරතුරු සොයා ගත්තා ය.
   (වංහුං, අගමුල, ඕපාදූප, ගුණදොස්)
2. රූපවාහිනී තිරය මත <u>විස්මයජනක</u> දසුන් මැවෙයි.
   (අකට විකට, අරුම පුදුම, තුටු පහටු)
3. රෝගාතුර වීම නිසා ඔහුගේ <u>මුළු ශරීරයම</u> වේදනා දුන්නේ ය.
   (ඇටකටු, ඇඟපත, කුදු මහත්)
4. ජයසේන තම <u>දරිද්‍රතාවය</u> දිරියෙන් ජය ගත්තේය.
   (දුගී දුප්පත්, දුගී මගී, පින් පව්)
5. කම්කරුවෝ <u>ඉතා ඉක්මනින්</u> පාරේ වැඩ නිම කළහ.
   (කඩිමුඩි, වැරවෑයම්, වෙහෙස මහන්සියෙන්)
6. වැඩි <u>වේතන</u> ඉල්ලා ඔවුහු වර්ජනය කළහ.
   (පඩිනඩි, නීතිරීති, ගණන් හිලවු)
7. නිසි කලට වැඩි ලැබීමෙන් මෙවර අස්වැන්න සරු විය.
   (රෑ දවල්, කලට වේලාවට, ගොඩමඩ)
8. ඩෙංගු මර්දනය වැඩසටහන යටතේ පාසල <u>පිරිසිදු කිරීම</u> ලබන සතියේ සිදු වේ.
   (හෙළි පෙහෙළි, ශුද්ධ පවිත්‍ර, කුණු කසල)
9. කාර්යාලයේ එදිනෙදා <u>ලේඛන</u> සියල්ල ගොනුගත කිරීමට උත්සාහ ගත්තාය.
   (ලියුම් කියුම්, කියුම් කෙරුම්, ගණන් හිලව්)
10. <u>උත්සාහයෙන්</u> කටයුතු කළ නිසා නවක සේවකයා ප්‍රධානීන්ගේ සිත් දිනා ගත්තේ ය.
    (ඇප උපකාර, කුදු මහත්, වැර වෑයම්)
11. ජීවිතයේ සැඳෑසමය ගෙවන සිරිතුංග මහතා <u>කුඩා දරුවන්ට</u> මහත් ඇලුමක් දැක්වීය.
    (ළමයි බමයි, ළමා ළපටි, කොල්ලෝ කුරුට්ටෝ)
12. සුළි සුළඟින් අනතුරට පත් ධීවර ජනතාව වෙත බොහෝ පර්ත්‍යාග ගලා එන්නට පටන් ගත්තේ ය. (උදව් පදව්, සල්ලි බාගේ, කෑම බීම)

# පිළිතුරු

1. වංහුං 2. අරුම පුදුම 3. ඇඟ පත 4. දුගී දුප්පත් 5. කඩිමුඩි

6. පඩිනඩි 7. කලට වේලාවට 8. ශුද්ධ පවිත්‍ර 9. ලියුම් කියුම් 10. වැර වෑයම්

11. ළමා ළපටි 12. උදව් පදව්